# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2105/19 - 2019 ජනවාරි මස 09 වැනි බදාදා - 2019.01.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරියේ නීතියේ 3(1) වගන්තිය යටතේ ප්‍රකාශයට පත්කර ඇති ප්‍රදේශ සඳහා වන උපදේශන කමිටුව පිහිටුවීම අනුමත කිරීමේ දැන්වීම

මහා නගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍ය, පාඨලී චම්පික රණවක වන මම 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය නීතියේ 7 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ''නාගරික සංවර්ධන ප්‍රදේශ වශයෙන් 3 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත්කර ඇති ඒ සියළු ප්‍රදේශ සඳහා උපදේශක කමිටුව (මෙහි මින්මතු ''උපදේශක කමිටුව'' යනුවෙන් සඳහන් කරනු ලබන) නමින් හඳුන්වන කමිටුවක් පිහිටුවීම අනුමත කර ඇති බව, කලින් කලට සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරියේ නීතියේ ව්‍යවස්ථාපිත විධිවිධාන යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.''

(අ) සංවර්ධන සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ බලාත්මක කිරීම සඳහා සහ ඒ පිළිබඳ ක්‍රියාමාර්ග ගැනීම සඳහා නාගරික සංවර්ධන ක්‍රියාකාරකම් විධිමත් කිරීම.

(ආ) 8ඒ(5) වගන්තිය යටතේ අධිකාරිය විසින් අවසරය ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් අගතියට පත් පාර්ශ්ව විසින් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා සලකා බැලීම.

(ඇ) කමිටුවේ බලතල, ක්‍රියාකාරකම් සහ වගකීම් ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම සහ සිදුකිරීම හා සම්බන්ධ හෝ ඊට අනුෂංගික ඒ සියලු කාර්යයන් හෝ කාරණා ඉටුකිරීම පිළිබඳ යම් කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා සහ අධිකාරිය වෙත උපදෙස් ලබාදීම.

උපදේශක කමිටුව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

i. අතිරේක ලේකම් (තාක්ෂණික) මහා නගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය (සභාපති)

ii. අධ්‍යක්ෂ ජනරාල්, නාගරික සංවර්ධන අධිකාරිය

iii. අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, නාගරික සංවර්ධන අධිකාරිය

iv. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්), නාගරික සංවර්ධන අධිකාරිය

v. අධ්‍යක්ෂ (නීති), නාගරික සංවර්ධන අධිකාරිය

vi. කමිටුව සම්බන්ධ සිද්ධි අධ්‍යයනයන් සමාලෝචනය කිරීම පිණිස ලේකම්, කැඳවුම්කරු සහ භාර නිලධාරී තනතුරේ කටයුතු කිරීම සඳහා උපදේශක කමිටුවේ සභාපතිවරයාගේ නියෝජිතයෙකු වශයෙන් එක් තැනැත්තෙකු පත්කළ යුතුය.

1. අනාගත මෙහෙයුම් සහ උපාය මාර්ග සම්බන්ධයෙන් අමාත්‍යවරයා වෙත උපදෙස් ලබාදීම සහ ඒ පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම උපදේශක කමිටුවේ කාර්යභාරය විය යුතුය.

2. නීතියේ මූලධර්ම සහ විධිවිධාන ක්‍රියාවට නැංවීම සහ ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා එයටම ආවේනික ක්‍රියාපටිපාටියක් නියම කිරීමට සහ නියාමනය කිරීමට උපදේශක කමිටුවට බලය පැවතිය යුතුය.

3. උපදේශක කමිටුවේ වගකීම් ඉටුකිරීමට සහ බලතල ක්‍රියාවේ යෙදවීම සඳහා අමාත්‍යවරයාට, ලිඛිතව විශේෂ හෝ සාමාන්‍ය නියෝග නිකුත් කළ හැකි අතර, උපදේශක කමිටුව විසින් ඒ නියෝග ක්‍රියාත්මක කළ යුතුය.

4. අධිකාරියට උපදෙස් අපේක්ෂාවෙන් ඕනෑම ගැටලුවක් උපදේශක කමිටුව වෙත යොමු කළ හැකි අතර, උපදේශක කමිටුව විසින් අවම කාල පරිච්ඡේදයක් තුළදී තම උපදෙස් ලබාදිය යුතුය.

5. උපදේශක කමිටු සාමාජිකයන්ගේ ධූර කාලය වසර 3 ක් විය යුතුය.

6. සාමාජිකයකු තම ධූරයෙන් ඉල්ලා අස්වීම හෝ ඔහුගේ ධූර කාලය අවසන් වීම මත නැවත පත්කිරීම සඳහා සුදුසුකම් ලබන්නේය.

7. (අ) උපදේශක කමිටුවේ ඕනෑම සාමාජිකයකුට අමාත්‍යවරයා වෙත ඉල්ලා අස්වීමේ ලිපිය යොමු කිරීම මඟින් තම ධූරයෙන් ඉල්ලා අස්විය හැකිය.

   (ආ) සාමාජිකයකුට තම සෞඛ්‍ය තත්ත්වය, විදේශ ගතවීම හෝ වෙනත් යම් හේතුවක් මත, තාවකාලිකව තම තනතුරේ වගකීම ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක, එසේ නොපැමිණෙන කාලපරිච්ඡේදය සඳහා ඔහු වෙනුවට සාමාජිකයෙකු වශයෙන් ක්‍රියා කිරීම සඳහා වෙනත් තැනැත්තෙකු පත් කිරීමට අමාත්‍යවරයාට හැකිය.

8. උපදේශක කමිටුවේ සාමාජිකයන් සහ අනෙකුත් නිලධාරින් හා සේවකයන් වෙත අධිකාරිය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් පාරිශ්‍රමිකයක් අරමුදලින් ගෙවිය හැකිය.

9. අමාත්‍යවරයාගේ අනුමැතිය සහිතව, මෙම බලතල යටතේ උපදේශක කමිටුවේ වගකීම් ඉටු කිරීම සඳහා සහාය වීම පිණිස යම් නිලධාරින් හෝ සේවකයන් පත්කිරීමට උපදේශක කමිටුවට හැකිය.

පාඨලී චම්පික රණවක,
මහා නගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2019 ජනවාරි මස 02 වැනි දින.

01 - 553

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.